(12)

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

නො.07, ග්‍රෙගරි මාවත, කොළඹ 07.
இல 7, கிரகறிஸ் மாவத்தை கொழும்பு 07
No 07 Gregory's Avenue Colombo 07

ෆැක්ස් / பெக்ஸ் / Fax 2684051
ඊමේල් / ஈ - மெயில் / E-mail Landcom@sltnet.lk

මගේ අංකය / எனது இல / MY NO | චක්‍රලේඛ අංක: 2008 / 05 | ඔබේ අංකය / உமது இல / YOUR NO | දිනය / திகதி / DATE 2008.10. 28

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
05 NOV 2008

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත
සියළුම නි.ඉ.කො/ස.ඉ.කො (අන්තර් පලාත්) වෙත

## බෞද්ධ විහාරස්ථාන සඳහා රජයේ ඉඩම් ලබාදීම

දැනට ක්‍රියාත්මක ඉඩම් නියෝග 200:3 හි උපදෙස් අනුව බෞද්ධ විහාරස්ථානයක් සඳහා ඉඩම් ලබාදීමේදී වැඩ පියවර 3 ක් අනුගමනය කිරීමට සිදුවේ.

i. ව්‍යවස්ථානුකූලව පිහිටුවා ගන්නා භාරකාර මණ්ඩලයට ප්‍රාරම්භක බදුකරයක් නිකුත් කිරීම.
ii. භාරකාර මණ්ඩලය විසින් පූජා ඔප්පුවක් සකස් කර විහාරාධිපති හිමියන්ට පූජා කිරීම.
iii. විහාරාධිපති හිමියන්ට අතිගරු ජනාධිපති තුමා විසින් නිදහස් දීමනා පත්‍රයක් ප්‍රදානය කිරීම.

02. මේ වනවිට විහාරස්ථානයක් සඳහා අවශ්‍ය සියලු අංගෝපාංග සංවර්ධනය කර ඇති හා විහාරාධිපති වරයෙකු පත් කර ඇති විහාරස්ථාන සඳහා ඉහත වැඩ පියවර ක්‍රියාත්මක කිරීමට සිදුවීම මගින් අනපේක්ෂිත ප්‍රමාදයන් සිදුවන බව පෙනී ගොස් ඇත. ඇතැම් බෞද්ධ විහාරස්ථාන සඳහා නැවත භාරකාර මණ්ඩල පත් කිරීමට සිදුවීම, පත් කල භාරකාර මණ්ඩල ක්‍රියාත්මක නොවීම, භාරකාර මණ්ඩල විසින් විහාරාධිපති ස්වාමීන් වහන්සේ වෙත ඉඩම් පූජා කිරීම ප්‍රමාද කිරීම. ප්‍රාරම්භක බදුකරයේ බදු මුදල් නොගෙවීම නිසා ප්‍රාරම්භක බදුකරය සකස් කිරීමට නොහැකිවීම, ඇතැම් විහාරස්ථාන සඳහා ප්‍රමාණවත් ආදායමක් නොමැති නිසා බදු ගෙවා ගැනීමට නොහැකිවීම වැනි කරුණු මත එම ඉඩම් වල අයිතිය තහවුරු කිරීම තවදුරටත් ප්‍රමාද වන බව පෙණේ.

03 මෙම හේතු සැලකිල්ලට ගෙන දැනටමත් සංවර්ධනය අවසන් කර ඇති විහාරස්ථාන සහ විහාරාධිපති වරයෙකු පත් කර ඇති බෞද්ධ විහාරස්ථාන සඳහා ඉහත සඳහන් වැඩ පියවර i හා ii සඳහන් අවශ්‍යතාවයන් ඉවත් කර කෙලින්ම නිදහස් දීමනා පත්‍රයක් ලබාදීම සඳහා යෝජනාවක් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර ඊට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත. මේ අනුව එවැනි සංවර්ධිත විහාරස්ථාන සම්බන්ධව පහත සඳහන් කඩිනම් පියවර ගෙන අපේක්ෂිත වාර්තා නොපමාව පළාත් ඉඩම් කොමසාරිස් / නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්(අන්තර් පළාත්) මගින් මාවෙත යොමු කිරීමට පියවර ගන්නා මෙන් උපදෙස් දෙමි.

04.(i). <u>දැනට අයිතිය සම්බන්ධ කිසිදු ලියවිල්ලක් නිකුත් කර නැති එහෙත් බෞද්ධ විහාරස්ථානයක් සඳහා අවශ්‍ය සංවර්ධන කටයුතු නිමකර විහාරාධිපති හිමියන් පත් කර ඇති බෞද්ධ විහාරස්ථාන</u>

මෙවැනි විහාරස්ථාන පිහිටි ඉඩම් සඳහා විහාරාධිපති හිමියන් නමින් නිදහස් දීමනා පත්‍රයක් නිකුත් කිරීම සඳහා ආ.ඒ.ආ. 118 දරණ ආකෘතියෙන් " O" රේඛා චිත්‍රයක් ලබා ගැනීම සඳහා මැනුම් නියෝගයක් නිකුත් කර පහත සඳහන් වාර්තා මාවෙත එවන්න. ( ඉඩම මේ වනවිට මැනුම් කර මූලික පිඹුරක් පිළියෙල කර නැතිනම් පළමුව ආ.ඒ.අ.08 න් මැනුම් ඉල්ලීමක් යවා පිඹුරක් පිළියෙල කර ගැනීම අවශ්‍යය.)

- ❖ බෞද්ධ විහාරස්ථානයක් සඳහා අවශ්‍ය සියලු ගොඩනැගිලි ආදිය තනා ඇති බවට ප්‍රාදේශීය ලේකම්/ නි.ඉ.කො.(අන්තර් පළාත්) ගේ සහතිකය
- ❖ විහාරාධිපති හිමියන් පත් කල බවට බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වරයා නිකුත් කළ සහතිකයේ පිටපත . මෙම සහතිකය තවමත් නිකුත් වී නොමැති නම් විහාරාධිපති ස්වාමීන් වහන්සේ පත් කළ බවට අදාළ නිකායේ මහා නායක හිමියන් විසින් නිකුත් කල අධිකාර පත්‍රය
- ❖ විහාරාධිපති හිමියන් අයත් වන නිකාය සහ එම නිකායේ මහා නායක ස්වාමීන් වහන්සේගේ නම.
- ❖ ප්‍රාදේශීය ලේකම්/ නි.ඉ.කො/ස.ඉ.කො(අන්තර් පළාත්) ගේ නිර්දේශය.

**04. (ii) දැනට ප්‍රාරම්භක බදුකරයක් නිකුත් කර ඇති බෞද්ධ විහාරස්ථාන**

දැනට ප්‍රාරම්භක බදුකරය නිකුත් කර ඇති, බදුනොගෙවීම නිසා අක්‍රිය වී ඇති , මූලික බදු මුදල නොගෙවීම නිසා බදුකරය තවම නිකුත් නොකල , බෞද්ධ විහාරස්ථාන වල එම බදු මුදල් කපා හැරීමට අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් අනුමැතිය ලැබී ඇති නිසා මෙවැනි බදුකර ලියවිලි ආපසු රජයට භාරගෙන අවලංගු කිරීම සඳහා මාවෙත එවිය යුතුය. ඒ සමග ඉහත 04 (i) කොටසේ සඳහන් වාර්තාද එවීමට කරුණාකර කටයුතු කරන්න.

**04.(iii) දැනට පූජා ඔප්පුවක් නිකුත් කර ඇති බෞද්ධ විහාරස්ථාන**

මෙවැනි විහාරස්ථාන සඳහා නිදහස් දීමනා පත්‍ර නිකුත් කිරීමට කිසිදු බාධාවක් නොමැති අතර එවැනි බෞද්ධ විහාරස්ථාන සඳහා නිදහස් දීමනා පත්‍රයක් ලබාදීම සඳහා අවශ්‍ය මැනුම් නියෝග යවා" O"ඩෙබා චිත්‍රයක් මා වෙත ලැබීමට සලස්වා ඒ සමඟ ඉහත 04.(i) කොටසේ සඳහන් වාර්තා නොපමාව මා වෙත එවන්න.

**05. ඉදිරියේදී නව බෞද්ධ විහාරස්ථාන ඉදිකිරීමට රජයේ ඉඩම් ලබාදීම.**

නව බෞද්ධ විහාරස්ථාන ඉදිකිරීම සඳහා ඉදිරියේදී රජයේ ඉඩම් ලබාදෙන විට මෙම චක්‍රලේඛයේ උපදෙස් අදාල නොවන අතර ඉඩම් නියෝග 200.3 හි සඳහන් ක්‍රියාමාර්ගයම අනුගමනය කළ යුතුය.

06 මෙම වැඩ පිළිවෙල ඉතා කඩිනමින් අවසන් කිරීමට බලාපොරොත්තු වන බැවින් නොපමාව අවශ්‍ය පියවර ගන්නා ලෙස කරුණාවෙන් දන්වා සිටින අතර ඒ සමඟ ඔබගේ කාර්යාලයට අනුයුක්ත බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිළධාරීන්ගේද සහාය ඇතිව **ඉහත සඳහන් 4.i, 4.ii,4.iii ,** වර්ග වලට අයත් බෞද්ධ විහාරස්ථාන පිළිබඳ නාම ලේඛනයක් ඉක්මනින් මාවෙත ලබාදෙන ලෙසත් කරුණාවෙන් දන්වා සිටිමි.

ඒ.ඩී.ඒ.බී.බොරලැස්ස,
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත්:- 1. ගරු ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය තුමා,
2 ජනාධිපති ලේකම් දැ.ගැ.ස.
3 ලේකම්, ආගමික කටයුතු හා සදාචාර කටයුතු අමාත්‍යාංශය දැ.ගැ.ස.
4 ලේකම්, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය.
5 මැනුම් පති . අවශ්‍ය කටයුතු සඳහා.
6බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් දැ.ගැ.ස.
7 සියළුම පළාත් ඉඩම් කොමසාරිස් වරුන් අවශ්‍ය කටයුතු සඳහා.